# පානදුර ප්‍රාදේශීය සභාව

## කළුතර දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 24 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ පළවන වැඩසටහනෙහි ප්‍රාග්ධන වැය වටිනාකම රු.2,125,359 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.2,116,369 ක් ලෙස සටහන් කිරීම හේතුවෙන් පළවන වැඩසටහනෙහි ප්‍රාග්ධන වැය රු.8,990 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාලව පුස්තකාල පොත් මිලදී ගැනීම් රු.300,000 ක් ප්‍රාග්ධන වැය යටතේ නොදක්වා පුනරාවර්තන වැය යටතේ දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය රු.300,000 ක් වැඩියෙන් හා ප්‍රාග්ධන වැය රු.300,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු රු.2,285,419 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන නොසැලසීම හේතුවෙන් වර්ෂයේ ණයහිමි වටිනාකම හා වර්ෂයේ වියදම රු.2,285,419 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) 2017 වර්ෂය වෙනුවෙන් සභාව සතු දේපල බදුදීමට ටෙන්ඩර දැන්වීම පල කිරීම සඳහා වැය කරන ලද රු.365,670 ප්‍රාග්ධන වැය යටතේ දැක්වීම හේතුවෙන් වර්ෂයේ

පුනරාවර්තන වැය රු.365,670 ක් අඩුවෙන් හා ප්‍රාග්ධන වැය රු.365,670 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී රු.24,772 ක් ගෙවා මිලදී ගෙන තිබූ පුටු 03 ක් රු.247,720 ක් ලෙස ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන් ලී බඩු හා උපකරණ සහ ප්‍රාග්ධනයට ආදායමින් දායක වීමේ ගිණුම් රු.222,948 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රාග්ධන ආධාර ලැබීම් වටිනාකම රු.17,031,760 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.16,031,810 ක් වශයෙන් දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර ලැබීම් රු.999,950 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයට අදාල රු.80,533 ක් වටිනා තොග අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.217,603 ක් වූ ස්ථාවර වත්කම්, තොග වශයෙන් දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ තොග ශේෂය රු.217,603 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයට අදාල රු.874,520 ක් වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ හා රු.111,196 ක් වූ ලී බඩු උපකරණ ප්‍රාග්ධනිත නොකිරීම හේතුවෙන් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ගිණුම හා ලී බඩු උපකරණ ගිණුම පිළිවෙලින් රු. 874,520 ක් හා රු.111,196 ක් අඩුවෙන් හා ප්‍රාග්ධනයට ආදායමින් දායක වීමේ ගිණුම රු.985,716 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර තැන්පත් ආයෝජන වටිනාකම රු.90,627,828 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.90,576,828 ක් ලෙස දැක්වීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට ආයෝජන වටිනාකම රු.51,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 86,631,153 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදයම රු.85,717,536 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත්

වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 74,790,834 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.10,926,702 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු.000' | රු.000' |
| (i) වරිපනම් හා බදු | 29,184 | 16,544 | 23,100 |
| (ii) බදු කුලී | 3,068 | 2,540 | 3,672 |
| (iii) බලපත්‍ර ගාස්තු | 404 | 404 | -- |
| (v) වෙනත් ආදායම් | 6,274 | 5,509 | 765 |

### 2.2.2 වරිපනම් බදු

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.21,225,825 ක හිඟයක් පැවති අතර වර්ෂය තුළදී හිඟයෙන් රු.11,094,615 ක් හෙවත් සියයට 52 ක් අයකරගෙන තිබුණි. පසුගිය වර්ෂයට අදාල හිඟ මුදලින් තවදුරටත් හිඟ ශේෂය රු.10,131,210 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බිල් කිරීම රු.26,558,409 ක් වූ අතර ඉන් වර්ෂය තුළදී රු.14,014,751 ක් හෙවත් සියයට 53 ක් අයකරගෙන තිබුණි. ප්‍රවර්තන බිල් කිරීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ශේෂය රු.12,543,658 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට සමස්ථ වරිපනම් හිඟය රු.22,674,868 ක් වූ අතර සමස්ථ අය කිරීමේ ප්‍රගතිය සියයට 53 ක් පමණක් විය. ඒ අනුව වරිපනම් ආදායම එකතු කිරීමේ ප්‍රගතිය සතුටුදායක මට්ටමක නොපැවතුණි.

(ඈ) සමස්ථ හිඟ වරිපනම් බදු ශේෂයෙන් සියයට 16 ක් එනම් රු.3,714,126 ක් වසර 5 ට වඩා පැරණි ශේෂ වූ අතර වරිපනම් ඒකක සංඛ්‍යාව 3533 ක් විය. සමස්ථ හිඟයෙන් සියයට 21 ක් එනම් රු.4,744,182 ක් වසර 3 කට වඩා පැරණි වූ අතර ඒකක සංඛ්‍යාව 4807 ක් විය.

2.2.3 **වයාපාර හා කර්මාන්ත බදු**

කර්මාන්ත බදු හා ව්‍යාපාර බදු ගෙවිය යුතු පුද්ගලයින් හා ආයතනවලින් එක් එක් වර්ෂය ආරම්භයේදී බදු මුදල් අය කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත බදු රු.180,800 ක් හා ව්‍යාපාර බදු රු.240,460 ක හිඟ ශේෂයක් පැවති අතර එම මුදල් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 **වෙළඳ ස්ථාන කුලී**

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.4,548,997 ක හිඟයක් පැවති අතර සමාලෝචිත වර්ෂයේදී ඉන් අයකර ගෙන තිබුණේ රු.1,404,982 ක් හෙවත් සියයට 31 ක් පමණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වෙළඳ ස්ථාන කුලී බිල් කිරීම රු.3,068,035 ක් වූ අතර වර්ෂය තුළ ඉන් රු.2,540,420 ක්

2.2.5 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 3,716,190 |
| (ii) | මුද්දර ගාස්තු | 62,995,351 |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **මෙහෙයුම්/කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) **වාහන පාලනය**

සභාව විසින් සිදු කර ඇති වාහන සමීක්ෂණය අනුව සභාව සතු වාහන 49 අතරින් වාහන 06 ක් දැනට සභාව සතුව නොමැති බව අනාවරණය විය.

(ආ) සභා බල ප්‍රදේශයට අයත් මාර්ග විවිධ කාර්යයන් සඳහා පළුදු කිරීමේදී අය කරන තැන්පත් මුදලින් පළුදු කරනු ලැබූ මාර්ග නැවත යථා තත්ත්වයට පත් කළ යුතු වුවත්

2016 වර්ෂයේදී මාර්ග පළුදු කිරීම වෙනුවෙන් ලබාගෙන තිබූ රු.2,109,238 ක මුදලින් කිසිදු මාර්ගයක් යථා තත්ත්වයට පත් කර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ත්‍රීරෝද රථ නැවතුම්පලවල් රාශියක් දක්නට ලැබුණද, එම නැවතුම්පලවලින් ගාස්තු අයකිරීම සඳහා සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා නීතිගත කරවාගෙන නොතිබුණි.

(ඈ) සභා බල ප්‍රදේශයේ හෝටල් දෙකක් හැර අනෙකුත් කිසිදු හෝටලයක් අවසන් ගිණුම් වාර්තා ඉදිරිපත් කර නොතිබූ අතර ඉදිරිපත් කරන ලද ආදායම් ඇස්තමේන්තු පදනම් කරගෙන සියයට 1 ක බද්ද ගණනය කිරීම නිසා සභාවට හිමි විය යුතු නියමිත බදු මුදල් ලැබී නොතිබුණි. තවද, සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් සංඛ්‍යාව තහවුරු කරගැනීමට ප්‍රාදේශීය සභාව නිසි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබීම නිසා බදු අය කළ යුතු සියළුම ආයතනවලින් බදු අය කර ඇති බවට තහවුරුවක් නොවුණි.

3.2 <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>

(අ) 2016 වර්ෂය සඳහා කසළ බැහැර කිරීම වෙනුවෙන් ටෙන්ඩර් කැඳවා අවම මිල ඉදිරිපත් කළ සුපර් කොම්පෝස්ට් ආයතනයට ටිපර් එකක් සඳහා රු.16,800 ක මිලකට ලබාදීමට තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර තිබුණද ටිපර් එකක් සඳහා රු.21,000 ක මිලක් නියම කර තිබූ GFC මැෂිනරීස් ආයතනයට එකී ටෙන්ඩරය ලබා දී තිබුණි. මෙම ආයතනයට එකී ටෙන්ඩරය ලබාදීම හේතුවෙන් සභාවට රු.1,780,800 ක පාඩුවක් සිදු වී තිබුණි.

(ආ) පානදුර ප්‍රාදේශීය සභාව කසළ කළමනාකරණය සඳහා කිසිදු වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක නොකිරීම නිසා 2015 ජූනි මාසයේ සිට 2016 දෙසැම්බර් දක්වා කාලය වෙනුවෙන් කසළ බැහැර කිරීම සඳහා සභාවේ ආදායමින් රු.10,332,000 ක මුදලක් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණි.

4. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වාහන පාලනය

(ඈ) සණ අපද්‍රව්‍ය කළමනාකරණය

(ඉ) අයවැය පාලනය